# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2399/31 – 2024 අගෝස්තු මස 28 වැනි බදාදා – 2024.08.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2019/301

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල**

**(131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමඟ කියවෙන) පනත් වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2021.04.24 වන දින අංක 2224/51 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2021.04.20 වැනි දින දරන නියෝගයෙන්,

දොඩම්පහල හේවගේ මිලන්කා උපුලනී මිය, “තාරින්දි”, හඹරගොඩ වත්ත, කරගස් වඟුර, කැප්පෙටිපොල.

සහ

රාජ්‍ය දැව සංස්ථාව, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

අතර පවත්නා 2021.04.09 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල් වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිලිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නීතිඥ ජනජිත් ද සිල්වා මයා වෙත යොමු කරන ලදි.

1A – G 042590 – 09 (2024/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරු නීතිඥ ජනජිත් ද සිල්වා මයා බේරුම්කාර ධූරයෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මා එම නියෝගය අවලංගු කරන අතර එකී 2021.04.20 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 අගෝස්තු මස 08 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2019/301

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිලිබඳව,

දොඩම්පහල හේවගේ මිලන්කා උපුලනී මිය, "තාරින්දි", හඹරගොඩ වත්ත, කරගස් වඟුර, කැප්පෙටිපොල.

සහ

රාජ්‍ය දැව සංස්ථාව, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මක ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බෙරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

මාතලේ, මැක්ඩොවල් බලකොටුව මාවත, පළමු පටුමග, 34/64, ඒ. බී. හේරත් මයා

පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 අගෝස්තු මස 08 වැනි දින,
කොළඹ දී ය.

EOG 08 - 0326/1

මගේ අංකය: IR/COM/01/2019/301

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන**
**කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

දොඩම්පහල හේවගේ මිලන්කා උපුලනී මිය, "තාරින්දි", හඹරගොඩ වත්ත, කරගස් වඟුර, කැප්පෙටිපොල.

සහ

රාජ්‍ය දැව සංස්ථාව, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට
හේතුවී පවත්නා කරුණ වනුයේ,

"තොග සමීක්ෂණ මණ්ඩලය විසින් කරන ලද සමීක්ෂණයේ දී අනාවරණය වූ දැවවල ඇති වූ ඌනතාවන් හා අතිරික්තයන්වල වටිනාකම් රාජ්‍ය දැව සංස්ථාවේ ගබඩා භාර නිලධාරිනියක වශයෙන් සේවය කරන දොඩම්පහල හේවගේ මිලන්කා උපුලනී මහත්මියගේ වැටුපෙන් අඩුකර ගැනීමෙන් ඇයට අසාධාරණයක් සිදුව තිබේ ද, යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ."

2024 අගෝස්තු මස 07 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදි.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

EOG 08 - 0326/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.